

අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා සහ අමාත්‍යාංශ නියෝජිත පිරිසක් පසුගිය 16 වැනිදා අධිකරණ කටයුතු සොයාබැලීම සඳහා යාපනයේ සංචාරයක නිරතවිය. එහිදී යාපනය, කිලිනොච්චිය ඇතුළු උතුර පළාතේ අධිකරණ බල ප්‍රදේශවල සංචාරය කළ ඇමැතිවරයා අධිකරණ බල ප්‍රදේශ නීතිය හා අධිකරණය සම්බන්ධ මහජන ප්‍රශ්න හා වැඩිදියුණු කළයුතු පහසුකම් පිළිබඳ සොයාබැලීය.

යාපනය අධිකරණ කලාපයේ විනිසුරුවන් හා නීතිඥයන් සමගද වෙන් වෙන්ව සාකච්ඡා කළ අමාත්‍යවරයා දැනට යාපනය දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති සමථ මණ්ඩලයන්හි සාමාජිකයන්ට යාපනය මහජන පුස්තකාල ශාලාවේ පැවැති සාමාන්‍ය නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු සැසි වාරයකටද සහභාගි විය. මෙහිදී අමාත්‍යවරයා යාපනය බන්ධනාගාරයේ නේවාසිකයන්ගේ සුවදුක් බැලීමට ගිය අවස්ථාව මෙහි දැක්වේ. මෙම අවස්ථාවට බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් වී. ආර්. ද් සිල්වා මහතා ඇතුළු අමාත්‍යාංශ නිලධාරීහු සහභාගි වූහ.